සියලු ම හිමිකම් ඇවිරිණි /
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වන පන්තියට (සාමාන්‍ය සේවා සංඛ්‍යාවට/විශේෂ සේවා සංඛ්‍යාවට) බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2010 (2011)
(II වන කොටස) - 2012

පැය තුනයි

## (04) වාක්‍ය රචනය

- මෙම ප්‍රශ්න පත්‍රය **කොටස් දෙකකින්** සමන්විත වන අතර, එම එක් එක් කොටස යටතේ විස්තර හතරක් බැගින් දී ඇත. එවා අතුරෙන් **එක් කොටසකින් එක් විස්තරයක්** බැගින් තෝරා, එය පදනම් කොට ගෙන **වචන 350 කට අඩු නොවන සේ** වාක්‍ය රචනා **දෙකක්** ලියන්න. අදාළ කොටස සමග අංකය ද ලියා උචිත **මාතෘකාවක්** ද යොදන්න. (උදා : II කොටස, අංක 6)

### I කොටස

1. ශ්‍රී ලංකාවෙහි මහා මාර්ගවල දැනට සිදුවන අනතුරු සංඛ්‍යාව සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත. ජනගහන වර්ධනය, වාහන සංඛ්‍යාව වැඩිවීම, මහා මාර්ග පද්ධතියේ ගුණාත්මකභාවය වෙනස්වීම වැනි කරුණු ද, වාහන පදවන්නන්ගේ අත්‍යවශ්‍ය මූලික දැනීමේ දුර්වලතාව සහ පදිකයන්ගේ අවධානය ප්‍රමාණවත් නොවීම ද, මෙයට හේතු ලෙස නිගමනය කළ හැකි ය. (ලකුණු 33 යි)

2. අධ්‍යාපනය ලැබීම, පුද්ගලයාගේ මූලික අයිතියක් වේ. එය සඵල කිරීම සඳහා ශ්‍රී ලංකාව යටත් විජිත වාදී පාලනයෙන් මිදීමටත් ප්‍රථම නිදහස් අධ්‍යාපනය ආරම්භ කෙරිණ. එය වඩාත් ස්ථාවර වශයෙන්ම හේතු වූයේ ස්වභාෂා මාධ්‍ය කොටගෙන උසස් අධ්‍යාපනය ලැබීමට අවස්ථාව ලැබීම නිසා ය. ඒ සමගම තරගකාරීත්වයේ ලක්ෂණ පහළ වූ අතර, අධ්‍යාපනයේ ගුණාත්මක භාවය පිළිබඳව ගැටලුවක් ද ඇති විය. මෙම හේතුව නිසා නිදහස් අධ්‍යාපනයක් ඉදිරි කාලය තුළ දී පවත්වා ගත හැකි ද? යන්න පිළිබඳ සැක මතු වී ඇත. (ලකුණු 33 යි)

3. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙහි ගුණාත්මක භාවය පිළිබඳ ගැටලු පැන නැඟී ඇති අතර, ජාත්‍යන්තර තරඟකාරී තත්ත්වය සමග සැසඳීමේ දී එහි පසු බෑමක් පැහැදිලිව ම දක්නට ඇත. දේශීය වශයෙන් ද විශ්වවිද්‍යාලවලින් පිටවන උපාධිධරයන්ට ශ්‍රම වෙළඳපළේ ගතික අවශ්‍යතා සම්පූර්ණ කිරීමට නොහැකි ව තිබේ. මෙම ගැටලු හඳුනාගෙන, විශ්වවිද්‍යාල පාඨමාලාවල අදාළත්වය හා ගුණාත්මක භාවය දියුණු කිරීමට ද, පාඨමාලා විවිධාංගීකරණයට ද, ද්විභාෂා අධ්‍යාපනයට (bi-lingualism) ද සැලසුම් ඉදිරිපත් ව තිබේ. (ලකුණු 33 යි)

4. ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවත්නා කුඩා රාජ්‍යයකි. එහි පිහිටීම ක්‍රමෝපායික වශයෙන් වැදගත් වන අතර, රටවැසියෝ සාක්ෂරතාව අතින් වැදගත් ස්ථානයකට පත් වූවෝ වෙති. මේ හේතුව නිසා විශේෂයෙන් ආසන්න රටවලට අධ්‍යාපන සේවා, සෞඛ්‍ය සේවා ආදිය සැපයීමෙන් ප්‍රමුඛත්වයට පත්විය හැකිය. ඒ මඟින් ස්වදේශිකයන්ගේ ජීවන තත්ත්වය උසස් තලයකට ගෙන ඒමට අවශ්‍ය ආර්ථික වර්ධනය ඇති වේ. මේ සඳහා අවශ්‍ය සාධනීය මානසික තත්ත්වය ජනනය කොට, වර්ධනය කිරීමට කාලය එළඹ ඇත. (ලකුණු 33 යි)

### II කොටස

5. ජලය වූ කලී මානව සංස්කෘතිය පවත්වා ගැනීම පිළිබඳ අත්‍යවශ්‍ය සාධකයකි. භූ තලයේ වැඩි කොටසක් ජලගෝලයෙන් ආවරණය වූව ද, පෘථිවිය මත පවත්නා පානීය ජල ප්‍රමාණය සීමිත ය. එය ආරක්ෂා කර ගැනීමට වර්තමානයේ දැඩි ප්‍රයත්නයක් ගත යුත්තේ කාර්මික අංශයේ සහ නව නිපැයුම්වල ප්‍රමාණය නොසිතූ පරිදි වර්ධනය වීම නිසා ය. එබැවින් සමාජයේ යහපැවැත්ම සඳහා ජල දූෂණය පාලනය කෙරෙන ජල කළමනාකාරීත්වයක් අත්‍යවශ්‍ය ය. (ලකුණු 34 යි)

6. රටක තිරසාර සංවර්ධනය පිණිස එම රට කවර ආකාරයකින් හෝ කෘෂිකර්මය අතින් වර්ධනය විය යුතු ය. එවිට ආහාර අතින් ස්වයංපෝෂිත විය හැකි ය. ස්වාභාවික ආපදා සහ මානව ක්‍රියා නිසා ඇතිවන වෙනත් ආපදාවලින් ගැලවීම සඳහා ආහාර සුරක්ෂිතභාවය ද අවශ්‍ය ය. තාක්ෂණික දියුණුව නිසා ඇතිවන නිෂ්පාදන අංශයේ වර්ධනය ද්විපීයික වන අතර, ඒ සඳහා අවශ්‍ය ප්‍රාග්ධන සම්භාරය, මඟ පෙන්වීම් සහ ආධාර විදේශවලින් ලබා ගැනීම අවශ්‍ය වෙයි. (ලකුණු 34 යි)

7. ගෝලීයකරණයේ ප්‍රතිඵල වශයෙන් ජාතීන් අතර, සබඳතාව වර්ධනය වෙමින් පවතී. සන්නිවේදන ක්‍රමවල බලපෑම මෙයට ඉවහල් වී ඇත. ඇතැම් තැන්හි දේශසීමා මැකී යන තත්ත්වය ද උද්ගතව ඇත. එය තහවුරු කිරීම පිණිස භාෂා හැදෑරීමේ උනන්දුව වැඩිවෙමින් පවතී. එහෙත් භාෂා හැදෑරීමේ අවස්ථාව ලැබෙන්නේ සීමිත පිරිසකට පමණි. ඒ පිළිබඳ විචල්‍යතා බහුල බැවිනි. එහෙයින් භාෂා පරිවර්තනය ප්‍රායෝගික අවශ්‍යතාවක් බවට පත්ව තිබේ. (ලකුණු 34 යි)

[ දෙවැනි පිටුව බලන්න

7. දියුණු වෙමින් පවතින රටවල දරිද්‍රතාව පිටුදැකීම සඳහා විවිධ මූල්‍ය හා ආර්ථික ප්‍රතිලාභ දියුණු රටවලින් ලැබී තැ
මෙය අගය කළ යුතු යහපත් ක්‍රියාවකි. එහෙත් එවැනි ප්‍රශංසනීය වනුයේ දියුණු රටවල් මගින් තාක්ෂණය, උපකරණ හා
උපදේශනය සපයමින් ස්වාධීනව නැගී සිටීම සඳහා දියුණු වෙමින් පවතින රටවලට ඉඩ ප්‍රස්තාව සැලසීමයි.

(ලකුණු 34 යි)

8. ධනවත් වීම නිසා මිනිසා තුළ තාවකාලික සන්තෝෂයක් ඇති වේ. එහෙත් මිනිසාගේ අභිලාෂය වනුයේ අනෙක් ධනවතුන් සමඟ තරග වදිමින් අසන්තෝෂකර ලෙස ධනය පසුපස හඹා යාමයි. මේ නිසා මිනිසා ක්‍රමයෙන් ධනයේ වහලෙකු බවට පත් වේ. ඔහු තුළ ඇති වන්නේ අසහනකාරී ස්වභාවයකි. මේ අනුව සන්තෝෂය හා සැනසුම රඳා පවතින්නේ ධනය මත ම නොවන බව පැහැදිලි ය.

(ලකුණු 34 යි)

## III කොටස

9. සාහිත්‍ය නිර්මාණකරණයෙහි යෙදීම ආර්ථික ප්‍රතිලාභ සඳහා හේතු වන්නේ ඉතා මඳ වශයෙනි. මෙහි දී විශාල ආර්ථික ප්‍රතිලාභ ලබන්නෝ ප්‍රකාශකයෝ සහ පොත් බෙදා හරින්නෝ ය. අද සාහිත්‍ය ග්‍රන්ථ ප්‍රකාශනය හා බෙදා හැරීම ඉහළ ධනෝපාර්ජන ව්‍යාපාරයක් බවට පත්ව තිබේ. මේ තත්ත්වය මඟ හරවා සාහිත්‍ය නිර්මාණකරණයෙහි යෙදෙන්නන්ටත් සිය ශ්‍රමයට හා කුසලතාවට ගැළපෙන සේ ආර්ථික ප්‍රතිලාභ ලබාගැනීමේ ක්‍රමයක් සකස් විය යුතු ය.

(ලකුණු 33 යි)

10. ජනමාධ්‍යවල කාර්ය භාරය විය යුත්තේ පුවත් හා තොරතුරු සපයමින් සමාජය දැනුවත් කිරීම හා විනෝදාස්වාදය සැපයීම පමණක් නොවේ. සමාජයේ පුද්ගලයන්ගේ බුද්ධි මට්ටම, සාමාන්‍ය ඥානය හා චින්තන ශක්තිය වර්ධනය කිරීම සඳහා ද ජනමාධ්‍ය ක්‍රියා කළ යුතු ය.

(ලකුණු 33 යි)

11. මෑත කාලීන සාමාජීය, ආර්ථික හා දේශපාලනික හේතු නිසා විස්තෘත පවුල් සංකල්පය මෙන් ම වයස්ගත වූවන් රැක බලා ගැනීමෙහි ලා පවුල සතුව පැවති හැකියාව ද ක්‍රමයෙන් අඩුවෙමින් පවතී. මේ නිසා අසරණ වයස්ගත වූවන්ගේ රැකවරණය සැපයෙන්නේ වැඩිහිටි නිවාස මගිනි. මේ තත්ත්වය මඟ හරවා, අදාළ පවුල් මගින් වයස්ගත වූවන්ගේ අවශ්‍යතා හා රැකවරණය සැපයිය යුතු අතර කිසියම් සුබ සාධන වැඩ පිළිවෙළක් රජය මගින් සංවිධානය කිරීම ද යෝග්‍ය වේ.

(ලකුණු 33 යි)

12. පුරුෂයාට හා සමාන අයිතිවාසිකම් කාන්තාවට ද හිමි විය යුතුය යන්න ස්ත්‍රීවාදයේ මූලික තේමාවයි. මෙහි දී වඩා වැදගත් වනුයේ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයේ කාර්ය භාරයන් හඳුනාගෙන සහභාගීව ක්‍රියා කිරීම විනා ඔවුනොවුන් අභිබවා තරග වදිමින් අනවශ්‍ය සමාජ ගැටලු උත්පාදනය කිරීම නොවේ.

(ලකුණු 33 යි)

* * *